**<u>හොරණ ප්‍රාදේශීය සභාව</u>**

**<u>කළුතර දිස්ත්‍රික්කය</u>**

**1. <u>මූල්‍ය ප්‍රකාශන</u>**

**1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 01 දිනද ඉකුත් වර්ෂයේ මූල්‍ය **ප්‍රකාශන** 2014 මැයි 16 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 ජූලි මස 15 වැනි දින ලේකම්වරයා වෙත යවන ලදී.

**1.2 <u>මතය</u>**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් බලපෑම හැර මූල්‍ය **ප්‍රකාශන** වලින් 2014දෙසැම්බර් 31 දිනට හොරණ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය හා එදිනෙන් අවසන්වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණමූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>**

**1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දේශීය ණය හා සංවර්ධන අරමුදලින් ලබාගෙන ඇති ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුල ගෙවන ලද රු.3,213,411 ක් වූ ණය වාරිකයෙන්, ණය වාරිකය, ණය මුදල හා පොලීමුදල වෙන් වෙන් වශයෙන් ගිණුම්ගත කල යුතු වුවත් මුළු වටිනාකම මුදල් පොත බැර කොට ප්‍රාග්ධන වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි .

(ආ) ණයගැතියන්ගෙන් ලද රු.194,906 ක චෙක්පත් අගරුවී එම මුදල මුදල් පොත බැර කර අගරු චෙක්පත් ගිණුමට හර කර තිබුණි. නැවත එම මුදල ණය ගැතියාගෙන් ලැබී තිබූ අතර අගරු චෙක්පත් ගිණුම එම ප්‍රමාණයෙන් බැර කල යුතු වුවත් එසේ නොකර මෙම මුදල පොලී ගෙවීම් ලාභාංශ හා ප්‍රසාද මුදල් යටතේ පුනරාවර්තන වියදමක් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී මාර්ග පළුදු ගාස්තු වශයෙන් අයකලරු 5,401,267 ක මුදල ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඈ) 2014 දෙසැම්බර් 31 දිනට ඉදිරිපත් කර තිබූ හිඟ ආදායම් වාර්තාව අනුව වරිපනම් බදු, අක්කර බදු, වෙළඳ බලපත්‍ර, විනෝද බදු හා කඩ කුලී වශයෙන් රු.11,241,916 ක් බිල්කර තිබුණද රු.9,615,363 ක මුදලක් පමණක් සමාලෝචිත වර්ෂයේ ආදායම ලෙස ගිනුම්ගත කර තිබීම හේතුවෙන් ලැබිය යුතු ආදායම රු.1,626,553 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ප්‍රාග්ධන වත්කම් අලුත්වැඩියා ගිණුම තුලනය කර ලබාගත යුතු ශේෂය රු.25,217,992 ක් වුවත් ශේෂ පිරික්සුමට රු.25,262,960 ක් ලෙස උපුටා ගැනීම හේතුවෙන් රු.44,968 කින් වියදම වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ මුද්දර ගාස්තු ලෙස හිඟහිටි වෙනත් ආදායම් ගිණුමට රු.37,808,154 ක් හර කර තිබුණද මුද්දර ගාස්තු ආදායම් ගිණුමට රු.16,871,062 බැරට සටහන් කිරීම හේතුවෙන්. රු.20,937,092 කින් මුද්දර ගාස්තු ආදායම අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(උ) රු.539,363 ක් වූ ස්ථාවර තැන්පත් පොලී සෘජු ප්‍රේෂණ ආදායම් වශයෙන් බැර කර රු.344,660 ක් වූ බැංකු ගාස්තු වියදම් වශයෙන් හර කර ආදයමෙන් වියදම හිලව් කර රු.194,703 ක මුදලක් විවිධ ආදායම් ලෙස ගිණුම් ගත කර තිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයේ මහජන බැංකු ස්ථාවර තැන්පත් ගිණුම් ශේෂය රු.21,198,992 ක් වුවද එදිනට බැංකු සනාථ සහතිකය අනුව ශේෂය රු 23,315,254 වූයෙන් රු.2,116,262 කින් පොලී ආදායම අඩුවෙන් ගිණුම් ගත කර තිබුණි.

(එ) ස්ථාවර වත්කම් ගිණුම් ශේෂ වල එකතුව හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීමේ ගිණුමේ ශේෂය සමාන විය යුතු වුවත් එම ගිණුම් අතර රු.9,366,773 ක වෙනසක් නිරික්ෂණය විය.

**1.3.2** **විගණනය සඳහා සාක්ෂි නොවීම**

විස්තරාත්මක උපලේඛන ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.129,277,457 ක් වූ ගිණුම් ශේෂ 8 ක්ද, ලිපිගොනු ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.3,994,697 ක් වූ ගිණුම් ශේෂ 2 ක් ද විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරික්ෂණය කිරීමට නොහැකි විය.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්ම වූ පුනරාවර්තන වියදම රු.16,006,325 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු.8,558,869 ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

**2.2.1** **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු.000' | රු.000' | රු.000' |
| වරිපනම් බදු | 8,282 | 9,602 | 13,982 |
| අක්කර බදු | 31 | 5 | 486 |
| කර්මාන්ත බදු | 625 | 625 | - |
| ව්‍යාපාර බදු | 2,542 | 2,542 | - |
| වෙළඳ බලපත්‍රගාස්තු | 943 | 926 | 20 |
| බදුකර කුලී | 425 | 425 | 181 |
| විනෝද බදු | 533 | 483 | 51 |
| කඩ කුලී | 1,452 | 3,012 | 482 |

**2.2.2** <u>වරිපනම් බදු</u>

**(අ)** 2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.13,982,677 ක් වූ හිඟ වරිපනම් බදු ශේෂයෙන් 2015 අප්‍රේල් 30 දින වන විට රු.4,289,754 ක හිඟ ශේෂයක් පවතින නමුත් විගණිත දිනය වූ 2015 ජුනි 15 වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) පෝරුවදන්ඩ උපකාර්යාලයට අයත් ආයෝජන කලාපයක් ලෙස දක්වා ඇති ප්‍රදේශයේ පිහිටි කර්මාන්ත ශාලා වලින් 2008 වර්ෂයේ සිට පැවත එන රු.8,411,805 ක් වූ හිඟ වරිපනම් බදු අයකර ගෙන නොතිබුණු අතර අනුමැතියකින් තොරව 2015 අප්‍රේල් 30 දින එම මුදල හිඟ ආදායම් වාර්තාවෙන් ඉවත් කර තිබුණි.

**2.2.3** <u>අක්කර බදු</u>

2014 දෙසැම්බර් 31 දිනට පැවති රු.486,141 ක් වූ හිඟ අක්කර බදු ශේෂයෙන් 2015 අප්‍රේල් 30 දින වන විට රු.117,179 ක හිග ශේෂයක් පවතින නමුත් විගණිත දිනය වූ 2015 ජුනි 15 වන විටත් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**2.2.4** <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

(අ) පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2014 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | |
|---|---|---|
| i. | උසාවි දඩ | 8,000,000 |
| ii. | මුද්දර ගාස්තු | 37,808,154 |

(ආ) හොරණ, කළුතර, පානදුර, දෙල්කඳ, හෝමාගම යන ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාල වලින් 2011 පෙබරවාරි සිට ලැබිය යුතු මුද්දර ගාස්තු වලට අදාල උපලේඛන පළාත් ආදායම් කොමසාරිස් ගෙන් ගෙන්වා ගැනීමට 2015 ජුනි 15 දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ උසාවි හා මුද්දර ගාස්තු ආදායම තීරණය කිරීමේදී සත්‍ය වශයෙන් ලැබිය යුතු ආදායම හඳුනාගෙන ගිණුම් ගත කළ යුතු වුවත් ඒ පිළිබඳව නොසලකා බිල් කර තිබීම හේතුවෙන් ලැබිය යුතු මුද්දර හා උසාවි දඩ ආදායම අඩුවෙන් දක්වා තිබුණි.

**3.** <u>**මෙහෙයුම් සමාලෝචනය**</u>

**3.1** <u>**මෙහෙයුම් අකාර්යක්ෂමතා**</u>

**3.1.1** <u>මාර්ග පළුදු තැන්පත්</u>

රජයේ හෝ වෙනත් ආයතන විසින් මාර්ග පළුදු විම වෙනුවෙන් 2013 වර්ෂයේදී සභාවට ගෙවන ලද රු.275,000 ක්හා 2011 වර්ෂයේදි ගෙවන ලද රු.990,990 ක් වශයෙන් එකතුව රු.1,265,990 ක් වූ තැන්පත් මුදල් අදාල මාර්ග පිළිසකර කිරිමකින් තොරව තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි.

**3.1.2 <u>සේවක ඇප තැන්පත්</u>**

**(අ)** සභාවේ ඇප තැබිය යුතු සේවකයින්ගෙන් රු.21,600 ක් ඇප තැන්පත් ලෙස අයකර තිබුණද බැංකු ගිණුම් විවෘත කර එම මුදල් තැන්පත් කර නොතිබුණි.

**(ආ)** සේවකයින් 7 දෙනෙකුගෙන් ලබාගත් රු.14,500 ක් වු ඇප තැන්පත් සඳහා පමණක් ගිණුම් විවෘත කර තිබුණ අතර ඉන් සේවකයින් දෙදෙනකු විශ්‍රාම ගොස් දෙදෙනකු ස්ථාන මාරු ලබා තිබුණද ඊට අදාල ඇප තැන්පත් නිදහස් කිරිමට කටයුතු කර නොතිබුණි.

**3.1.3 <u>වාහන පාලනය හා නඩත්තුව</u>**

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ

(අ) විගණිත දිනය වූ 2015 ජුනි 15 වන විට වාහන 25 ක් සභාවේ පැවතුනද ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1647 (ඉ) ප්‍රකාරව වාහන ලේඛණයක් සභාව පවත්වා නොතිබුණි.

(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1647(අ) ඡේදයේ දක්වා ඇති පරිදි වාහනයේ උපකරණ පිළිබද සම්පූර්ණ සමීක්ෂණයක් පවත්වා නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 1645 (ආ) සහ (ඇ) හා 1646 ප්‍රකාරව සභාවේ කිසිඳු වාහනයක අදාල මාසික සාරාංශ සකස් කර නොතිබූ අතර ධාවන සටහන්ද විගණකාධිපතිට ඉදිරිපත් කර නොතිබුණි.

(ඈ) 1990 ඔක්තෝබර් 10 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 41/90 ප්‍රකාරව වාහන වල ඉන්ධන දහනය පිළිබදව පරීක්ෂා කර නොතිබුණි.

(ඉ) වසර කිහිපයක සිට වාහන 07 ක මයිලෝ මීටර ක්‍රියා විරහිතවී තිබුණද ඒවා අලුත්වැඩියා කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) අත් ට්‍රැක්ටරයක් හා ට්‍රේලරයක් 2008 වර්ෂයේ සිට ධාවනයෙන් තොරව පවතින බැවින් අපහරණය කිරීමට පියවර ගෙන නොතිබුණි.

**3.1.4 <u>මෝටර්ග්‍රේඩරය හා J C B යන්ත්‍රය</u>**

**(අ)** ඉහත යන්ත්‍ර මාර්ග තැනීම සඳහා යොදාගෙන තිබූ නමුත් ඒ කිසිඳු කාර්යයක් සඳහා ඉදිරි වැඩ සැළැස්මක් හා කාර්ය සඳහා අනුමත ඇස්තමේන්තු නොතිබුණි. සභාපති විසින් ලබාදෙන උපදෙස් මත සේවයේ යොදවා තිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුලදී මෝටර්ග්‍රේඩරය අලුත්වැඩියා සඳහා රු. 535,482 ක්ද දරා තිබුණු අතර J C B යන්ත්‍රයේ ඉන්ධන හා නඩත්තු වියදම් සඳහා රු.2,001,990 ක් වැයකර තිබුණි.

**3.1.5 <u>අත්තිකාරම් ගෙවීම</u>**

ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි 371(ආ) ප්‍රකාරව මාණ්ඩලික නිලධාරියකුට රු.20,000 ඉක්මවා අත්තිකාරම් ලබාගත නොහැකි වුවත් එම සීමාව ඉක්මවා රු.857,047 ක් අත්තිකාරම් ගෙවා තිබුණි.

**3.1.6 <u>සේවක ණය</u>**

(අ) සේවක ණය ශේෂය තුල සේවය හැර ගිය නිලධාරීන් 23 දෙනෙකුගෙන් 2014 දෙසැම්බර් 31 දිනට අයවියයුතු ශේෂය රු.186,111 ක් විය. 2015 මැයි 30 වන විට තවදුරටත් අයවිය යුතු රු.179,611 ක මුදල අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සේවක ණය ලේඛණය අනුව ස්ථාන මාරුවී ගිය සේවකයින්, ආදේශක හා ව්‍යාපෘති සේවකයින් 19 දෙනෙකුගෙන් රු.35,646 ක මුදලක් වැඩියෙන් අයකර තිබුණි. මෙම මුදල් අදාල පුද්ගලයින් වෙත ආපසු ලබාදීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) ආදේශක සේවකයින් 7 දෙනෙකුගෙන් අයවිය යුතු රු.15,000 ක මුදල අදාල ඇපකරුවන්ගෙන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3.1.7 <u>අයවැය පාලනය</u>**

(අ) 2014 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුව අනුව වැය විෂයන් 24 ක් සඳහා එකතුව රු.4,514,500 ක් වූ මුදලක් වෙන්කර තිබූ නමුත් වර්ෂය අවසානයට ඉන් කිසිදු මුදලක් වැය කර නොතිබුණි.. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබූ බව අනාවරණය විය.

(ආ) වැය විෂයන් 10ක් සඳහා එකතුව රු.18,262,800 ක ප්‍රතිපාදන අදාල කාර්යය ඉටු නොකිරීම හේතුවෙන්වෙනත් වැය විෂයන්ට මාරු කර තිබුණු අවස්ථාවන් නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රතිපාදන සැලසීමෙන් අපේක්ෂිත අරමුණු ඉටුකර ගැනීමට ක්‍රියාත්මක වී නොතිබුණු බව විගණනයට තහවුරු විය.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පසුගිය වර්ෂයේ සිදුකල පළාත් නිශ්චිත ව්‍යාපෘති වෙනුවෙන් ගෙවිය යුතු වියදම් ලෙස රු.99,506 ක මුදලක් වැඩියෙන් ප්‍රතිපාදනය කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂයන්ට අදාලව මහනැගුම ව්‍යාපෘතිය යටතේ ගෙවිය යුතු වියදම් ලෙස රු.308,641 ක මුදලක් සඳහා ප්‍රතිපාදන සලසා නොතිබුණු අතර ආදායම් හා වියදම් ගිණුමටද ගිණුම්ගත කර නොතිබුණි.

**4. <u>පද්ධති හා පාලන</u>**

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) වත්කම් කළමණාකරණය.
(ඈ) ආදායම් පරිපාලනය
(ඉ) මානව සම්පත් කළමණාකරණය.